ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

2022-09-08

මගේ අංකය } எனது இல. } My No. }

ඔබේ අංකය } உமது இல. } Your No. }

දිනය } திகதி } Date } 2022/09/

පැමිණිලි පාර්ශවය : කේ.එල් වන්නිසිංහ මයා,
අංක : 1/25/සී, වාවින්න,
පරගහකැලේ.

වගඋත්තර පාර්ශවය : 01. ප්‍රධාන විධායක නිලධාරී,
ගල්ඔය වැවිලි සමාගම,
හිඟුරාන.

02. අධ්‍යක්ෂ,
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
මාතර.

03. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සමන්තුර.

04. කේ. රවී මයා,
ග්‍රාම නිලධාරී,
891, වලතාපිටිය 01.

05. වාරිමාර්ග ඉංජිනේරු,
වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය,
සමන්තුරේ.

<u>පැමිණිලි අංකය : HRC/AM/53/19</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, තමා විධිමත් ක්‍රියාපටිපාටිය අනුව AL/B/AMP/682 අංක දරණ වැලි කැනීම් බලපත්‍රය ලබාගැනීමෙන් පසු අදාළ වැලි කැනීම් කර ප්‍රවාහනය කරන ලද බවත්, නමුත් ඒ සඳහා තමා විසින් භාවිතා කළ මාර්ගය හිඟුරාන සීනි සමාගමේ නිලධාරීන් එය තම ආයතනයට අයත් මාර්ගයක් බව පවසා, එම මාර්ගයට හානි කර වැලි

ප්‍රවාහනයට බාධා පමුණුවා ඇති බවත් සඳහන් කර ඇත. එම මාර්ග ගොවි ජනතාව සිටි කුඹුරුවලට යාමට භාවිතා කරන හා ගඩොල් කර්මාන්තකරුවන් තම ගඩොල් ඇදීමට යොදාගන්නා පොදු මාර්ග බැවින් හා නීත්‍යානුකූල ව්‍යාපාරයක් හිමි තමන්ගේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාමට නොදීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බැවින්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

වගඋත්තර පාර්ශවය විසින් සිය කරුණු දැක්වීමේදී ප්‍රාදේශීය ලේකම්, සමන්තුර හා ග්‍රාම නිලධාරී වලතාපිටිය සඳහා නිර්දේශ ලබා දීමට සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ජනතාව පොදු මාර්ගයක් ලෙස භාවිතා කරන මාර්ගය වැලි ප්‍රවාහනය සඳහා නිර්දේශ කළ බවත්, එය සීනි සමාගමට අයත් බව දැනනොසිටි බවත් සඳහන් කර ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙන්ම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශ නියෝජිතයන් ද අදාළ මාර්ගය තමන් ද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය කළ බවත්, එය ගොවි ජනතාව සිය කුඹුරු සඳහා හා වෙනත් වගාබිම් සඳහා යාමට භාවිතා කරන පොදු මාර්ගයක් වූ බැවින් එයින් වැලි ප්‍රවාහනයට ඉඩ සලසා බලපත්‍ර අනුමැතිය හා බලපත්‍ර ලබා දීම සිදුකළ බවත් සඳහන් කර ඇත. එසේම, වැලි කැනීම් බලපත්‍රයේ වැලි ප්‍රවාහනය සඳහා භාවිතා කරන මාර්ග වලට යම් හානියක් සිදුවේ නම් ඒවා අලුත්වැඩියාව ද බලපත්‍රලාභියා සිදුකළ යුතු බවට කොන්දේසියක්ද පනවා ඇති බවත්, එම කොන්දේසි උල්ලංඝනය කරන්නේ නම් බලපත්‍ර අවලංගු කිරීම සිදුකරන බව ද වැඩිදුරටත් දන්වා ඇත.

හිඟුරාන සීනි සමාගම් නියෝජිතයන් පැමිණිලිකරු වෙත වැලි ප්‍රවාහනය සඳහා අනුමැතිය දී ඇති මාර්ගය හිඟුරාන සීනි සමාගමට අයත් උක් ඉඩම්වලට පිවිසීම සඳහා ඉදිකර ඇති ක්ෂේත්‍ර මාර්ග බව දක්වා ඇත. අදාළ ඉඩම්වල ගල්ඔය වැවිලි සමාගම විසින් ගොවීන් සමඟ ගිවිසුම්ගතව උක් වගාකිරීම සිදුකරන බවත්, එම ක්ෂේත්‍ර මාර්ග ඔස්සේ වැලි ප්‍රවාහනය කිරීමෙන් ඒවාට බරපතල හානි සිදුවන බවත් සඳහන් කර ඇත. එසේ හානි සිදුවූ විට උක් ගොවීන්ට වගා ක්ෂේත්‍ර වෙත පිවිසීමට හා වගාවෙහි අස්වනු ප්‍රවාහනයට මෙන්ම වගාබිම් වෙත ජලය ලබා ගැනීමට බාධා පැමිණෙන බවත්, එසේම අදාළ මාර්ග නඩත්තුව ගල්ඔය වැවිලි සමාගම විසින් සිදුකරන බවත්, වැලි ප්‍රවාහනය කර ක්ෂේත්‍ර මාර්ග වලට හානි සිදුවූ විට ඒවා අලුත්වැඩියාවට කිසිදු ආයතනයක් මැදිහත් නොවන බවත් දන්වා ඇත. එබැවින්, තම ක්ෂේත්‍ර මාර්ග ඔස්සේ වැලි ප්‍රවාහනය නතර කිරීමට කටයුතු කරන ලෙස අම්පාර දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය දැනුවත් කර ඇති බවද සඳහන් කර ඇත. එසේ තිබියදී තම ක්ෂේත්‍ර මාර්ග ඔස්සේ වැලි ප්‍රවාහනයට ඉඩ ලබාදිය නොහැකි බවද ගල්ඔය වැවිලි සමාගම් නියෝජිතයන් දන්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :-**

පැමිණිලි පාර්ශවය, සමන්තුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වලතාපිටිය ග්‍රාමයේ මොරවිල්ආරු නමැති ස්ථානයේ වැලි කැනීම් කිරීම සඳහා AL/B/AMP/682 අංක දරණ බලපත්‍රය මාස 03 ක කාලසීමාවක් සඳහා නීත්‍යානුකූලව ලබාගෙන ඇති බව අනාවරණය වේ.

එම බලපත්‍රය වැලි නිධිය කැනීම් කිරීම සඳහා පවතින්නේ නම් නැවත අළුත් කරමින් ලබාදෙන බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීමේ දෙපාර්තමේන්තුව හා පැමිණිලි පාර්ශවය කොමිෂන් සභාව හමුවේ අනාවරණය කර ඇත.

එම බලපත්‍රයට අනුව වැලි ප්‍රවාහනය සඳහා භාවිතා කරන මාර්ගය ග්‍රාම නිලධාරී නිර්දේශ කර ඇති බව අනාවරණය වේ.

එම නිර්දේශිත මාර්ගය මතින් වැලි ප්‍රවාහනය කරමින් සිටියදී ගල්ඔය වැවිලි සමාගම විසින් තම ක්ෂේත්‍ර මාර්ගයක් ලෙස හඳුන්වා වැලි ප්‍රවාහනයට බාධා කර ඇති බව අනාවරණය වේ.

උක්ත මාර්ගය දෙපස හිඟුරාන සීනි සමාගම සතු ගොවීන් සඳහා ලබා දී ඇති උක් වගා ඉඩම් පිහිටා ඇති බවත්, ඒ අනුව එය සීනි සමාගම සතු ක්ෂේත්‍ර මාර්ගයක් බව ද අනාවරණය වේ. එසේ වුවද මොරවිල්ආරු ප්‍රදේශයේ ඇති පුද්ගලික කුඹුරු ඉඩම් සඳහා ගොවීන් ගමන් කිරීමට යොදාගන්නා පොදු මාර්ගයක් බව ද අනාවරණය වේ.

1989 වසරේ සිට සීනි සමාගම අක්‍රියව පැවතුනු අතර, 2010 වසරේදී පමණ ගල්ඔය වැවිලි සමාගම එහි පාලන කටයුතු භාරගන්නා තෙක් අදාළ මාර්ග, පොදු මාර්ග ලෙස ජනතාව සිය පෞද්ගලික කටයුතු හා ව්‍යාපාරික කටයුතු සඳහා (ගල්,වැලි,ගඩොල් ප්‍රවාහනය) යොදාගෙන ඇති බව අනාවරණය වේ.

හිඟුරාන සීනි සමාගම සතු උක් වගා භූමි වෙත ප්‍රවේශවීමට මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව හා අධිකාරිය සතු මාර්ග, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු මාර්ග මෙන්ම සීනි සමාගම සතු ක්ෂේත්‍ර මාර්ග ද පවතින අතර, එම මාර්ග සියල්ල ජනතාව මෙන්ම ගල්ඔය වැවිලි සමාගම ද තම කටයුතු සඳහා භාවිතා කරන බව අනාවරණය විය.

හිඟුරාන සීනි සමාගම සතු ක්ෂේත්‍ර මාර්ග වල නඩත්තු කටයුතු ගල්ඔය වැවිලි සමාගම විසින් සිදුකරන බව අනාවරණය වන නමුත්, පැමිණිලිකරු විසින් ද පෙර අවස්ථාවල මාර්ග නඩත්තුව සිදුකර ඇති බවද අනාවරණය වේ.

වැලි කැනීම් බලපත්‍රය අනුව වැලි ප්‍රවාහනය කරන මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම බලපත්‍රලාභියාගේ වගකීම බවත්, ප්‍රවේශ මාර්ගය ලෙස කෘෂිකාර්මික පාරවල් භාවිතා කිරීමේදී ඒවාට සිදුවන හානි ව්‍යාපෘති යෝජක විසින් පිළිසකර කළ යුතුය යනුවෙන් කොන්දේසියක් පනවා ඇති බවත් අනාවරණය වේ.

ගල්ඔය වැවිලි සමාගමේ ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් තම කුඹුරු සඳහා ගමන් පහසුකම් සලසා ගන්නා මොරුවිල්ආරු ප්‍රදේශයේ හා ගල්ඔය වැවිලි සමාගමේ ක්ෂේත්‍ර වෙත ගමන් ගන්නා මාර්ග දෙකක් යන්ත්‍ර යොදා හානියට පත්කර ජනතාවගේ ගමනාගමන පහසුකම් සම්පූර්ණයෙන්ම වළක්වා ඇති බව අනාවරණය

වන අතර, එය සිදුකර ඇත්තේ පැමිණිලි පාර්ශවය විසින් එම මාර්ග හරහා වැලි ප්‍රවාහනය කිරීම වැළැක්වීම සඳහා වේ. මෙම තත්වය කොමිෂන් සභාව කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය වී ඇත.

උක්ත මාර්ග වසා දැමීම සම්බන්ධයෙන් හිඟුරාන සීනි සමාගමේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු හෝ ප්‍රධාන විධායක නිලධාරී දැනුවත් කර ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොමැති බවත්, ක්ෂේත්‍ර නිලධාරීන් තම අභිමතය අනුව කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

මොරුවිල්ආරු ප්‍රදේශයේ ඇති සියලුම මාර්ග, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගල්ඔය වැවිලි සමාගමට අයත් සියලුම මාර්ග, එහි ජනතාව හා ගල්ඔය වැවිලි සමාගම තම ගමනාගමන පහසුකම් සඳහා දීර්ඝ කාලයක සිට භාවිතා කළ මාර්ග බව ද අනාවරණය වේ. එම ප්‍රදේශයේ වී ගොවිතැන්, ගඩොල් ව්‍යාපාරය ද දැනටමත් ක්‍රියාත්මක වන අතර, එම ජනතාව ද මෙම මාර්ග භාවිතා කරන බව අනාවරණය වේ.

ඒ සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ගල්ඔය වැවිලි සමාගමේ ක්ෂේත්‍ර නිලධාරීන් අදාළ මාර්ගය කඩා, වසා දැමීම සාධාරණීකරණය කිරීම සඳහා එම මාර්ගය හරහා ජල පහසුකම සැපයීමට අවශ්‍ය ජල නල එළීම සඳහා එසේ කළ බවට කොමිෂන් සභාව වෙත ක්ෂේත්‍ර පරීක්ෂණයේදී කරුණු දක්වා ඇති නමුත්, එවැනි දෙයකට කිසිදු පූර්ව සූදානමක් දැකිය නොහැකි වූ අතර, තාක්ෂණික නිලධාරීන් නොවුනද ඕනෑම කෙනෙකුට පෙනුන සත්‍ය වූයේ මාර්ගය කඩා බිඳ දමා ඇත්තේ වෙනත් අරමුණක් සඳහා බවයි. ඒ අනුව මාර්ගය කඩා බිඳ දමා අවහිර කර ඇත්තේ වැලි ප්‍රවාහනය වැළැක්වීම සඳහා බව පැහැදිලි වේ. ඔවුන්ගේ කරුණු දැක්වීම් වලදී එම මාර්ග හරහා වැලි ප්‍රවාහනය සඳහා ඔවුන්ගේ විරුද්ධත්වය පළවීම හා ඉදිරිපත් වූ කරුණු මත අදාළ මාර්ග වලට හානි කිරීම, වැලි ප්‍රවාහනය නතර කිරීම සඳහා සිදුකර ඇති බවක් ද නිරීක්ෂණය විය. අදාළ මාර්ගවල වැලි ප්‍රවාහනයට ඉඩදීම හෝ නොදීම නීතිමය වශයෙන් විසඳාගත යුතු ප්‍රශ්නයක් වන අතර, මේ ආකාරයෙන් පොදු ප්‍රවාහන මාර්ග කඩා දැමීම අවහිර කිරීම එයට පිළියමක් නොවේ.

**නිගමනය :-**

මොරුවිල්ආරු ප්‍රදේශයේ වාරිමාර්ග හා අනෙකුත් මාර්ග, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, හිඟුරාන සීනි සමාගම හා ගල්ඔය වැවිලි සමාගම මඟින් හෝ වෙනයම් පාර්ශවයක් විසින් ඉදිකළ ද, ඒවා සියල්ල පොදු මාර්ග වන අතර, එවැනි පොදු මාර්ග වසා දැමීම, කොටසක් වසා දැමීම හෝ අවහිර කිරීම සිදුකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නීති තත්වයක් පවතී. (ජාතික මංමාවත් පනත - National Thoroughfares Act, No 40 of 2008) ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකාව තුළ පොදු මාර්ග වසා දැමීමක් සිදුකර නොමැති අතර, අධි ආරක්ෂිත කලාප ද ඉවත්කර ඇත.

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 297/2007 V.I.S Rodrigo Vs S.I Imalka and Other හා අංක 298/2005 Padma Vigesooriya and M. Cristy vs. Gunathilaka යන නඩු තීන්දු වලින් ගරු

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නියෝග පරිදි ශ්‍රී ලංකාවේ පොදු මාර්ග භාවිතා කිරීමට හා ඒ හරහා යාම් ඊම් කිරීමට තහනම් පැනවිය නොහැකි බව අතිශයින් යුද්ධය පැවැති සමයේ වුවද ලබා දී ඇත.

මේ අනුව පැමිණිල්ලට අදාළ මොරුවිල්ආරු ප්‍රදේශයේ පොදු මාර්ග අවහිර කිරීමට වගඋත්තරකාර ගල්ඔය වැවිලි සමාගමින් කටයුතු කිරීම නීතිවිරෝධී වන අතර, ඒ අනුව පැමිණිලි පාර්ශවයේ හා එම මාර්ගවල ගමන් ගන්නා ජනතාවගේ යාම් ඊම් අයිතිය උල්ලංඝනය වන අතර, එයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) හා (14) වන වගන්ති වලින් පිළිගෙන ඇති මූලික අයිතීන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

එබැවින්, පැමිණිලිකරු වෙත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයට අදාළව වැලි ප්‍රවාහනය සඳහා නිර්දේශිත මාර්ග වල වැලි ප්‍රවාහනයට ඉඩ ලබාදිය යුතු අතර, ඒ සඳහා වගඋත්තර ගල්ඔය වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීගේ ඍජු මැදිහත් වීම මත සිදුකරන සියලුම බාධක අවහිරතා නතර කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.10.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- අම්පාර ප්‍රාදේශීය කාර්යාලය,
මානව හිමිකම් කොමිෂන් සභාව.

B/-